කොවිඩ්-19 සම්බන්ධයෙන් ජනමනසට ආතතිය සහ ඉච්ඡාභංගත්වය ඇතිවන අකාරයට නොව, අනාගතය සම්බන්ධයෙන් ධනාත්මක බලාපොරොත්තු සහ එකිනෙකා අතර සහයෝගය ඇති වන ලෙස වාර්තාකරණයන් සිදුකරන ලෙසින් සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය විසින් ජනමාධ්‍ය වෙත නිර්දේශ කර ඇත. එනමුත් "ඉන්දීය කොරෝනා යක්ෂයා මාදිවෙල මාර්ග දෙකක් වහයි" වැනි සිරස්තල ඔස්සේ එම නිර්දේශයන් කෙතරම් දුරට ආරක්ෂා කෙරෙන්නේද යන්න පැනයකි. මේ ලංකාදීප (06/23) පුවත් වාර්තාවක සිරස්තලයයි.
එසේම, විවිධ රටවලින් වාර්තා වන සාර්ස්-කොව්-2 වෛරස ප්‍රභේදයන් සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් නව නාමකරණයක් හඳුන්වා දෙන්නේ, තවදුරටත් ඒ ඒ වෛරස ප්‍රභේදයන් සොයාගත් රටවල නම් ඔස්සේ නව වෛරස ප්‍රභේදයන් නොහැඳින්වීම සඳහායි. මෙම නව නාමකරණය සමගින් බොහෝ මාධ්‍ය රටවල නම් ඔස්සේ වෛරස ප්‍රභේදයන් හැඳින්වීම සැලකිය යුතු ලෙසින් අඩු වී ඇති බව නිරීක්ෂණය කිරීමට හැකි විණි. එනමුත්, තවමත් ඇතැම් මාධ්‍ය නව නාමකරණයට අනුගත වී නොතිබීම සැබවින්ම කණගාටුවට කාරණයකි. "ඉන්දීය කොරෝනා" වැනි යෙදුම් ඔස්සේ වෛරස ප්‍රභේදයන් නොහඳුන්වන ලෙසින් උපදෙස් ලබාදෙන්නේ, වක්‍රාකාරීව එම රටවල් සහ ජාතිකයින් සම්බන්ධයෙන් කොන් කිරීමේ ආකල්පයක් ඇති නොවීමටයි.
කොරෝනා ගෝලීය වසංගතය මර්දනය සඳහා සටන් වදින මේ මොහොතේදී, සිය වගකීම නිවැරදිව ඉටු කිරීම මාධ්‍යයේ වගකීමයි.
මූලාශ්‍ර:
https://www.nature.com/articles/d41586-021-01483-0
https://www.youtube.com/watch?v=8BRbVG5-47Y&t=1211s
https://mcusercontent.com/.../6a771830-d3bd-456e-8fbf...
#MediaEthicsSL #lka #SinhalaNews #Lankadeepa